# සියලු සාන්තුවරයන්ගේ
## මංගලෝත්සවය

## පළමුවන දේව ප්‍රකාශනය එළිදරව්ව 7:2-4, 9-14

*එළිදරව්ව පොතෙන් උපුටා ගත් කොටසකි.*

"සියලු ජාතීන්ගෙන් ද ගෝත්‍රවලින් ද ඉමහත් පිරිසක් මම දිටිමි."

තවත් දේව දූතයෙකු ජීවමාන දෙවියන් වහන්සේගේ මුද්‍රාව රැගෙන පෙරදිගින් නැගී එනු දිටිමි. ඔහු ගොඩටත් මුහුදටත් අනතුරු කරන්නට බලය ලත් දේව දූතයන් සතර දෙනාට මහ හඬකින් මොරගසා, "අපේ දෙවියන් වහන්සේගේ සේවකයන්ගේ නළල් මත මුද්‍රා සලකුණ තබන තුරු, ගොඩට වත්, මුහුදට වත්, ගස්වලට වත් අනතුරක් නොකරන්නැ"යි කී ය. තවද, මුද්‍රා සලකුණ ලත් අයගේ ගණන මට ඇසුණේ ය. සියලු ඉශ්රායෙල් ගෝත්‍රවලින් මුද්‍රා සලකුණු ලත් අය එක් ලක්ෂ සතළිස් සාර දහසක් වූ හ.

ඉන්පසු සියලු ජාතීන්ගෙන් ද ගෝත්‍රවලින් ද ජන සමූහයාගෙන් ද භාෂාවන්ගෙන් ද කිසිවෙකුට ගණන් නොකළ හැකි තරම් ඉමහත් පිරිසක්, සුදු සළු පැළඳ, තල පත්‍ර අතින් ගෙන, සිංහාසනය හා බැටළු පෝතකයාණන් ඉදිරියෙහි සිටිනු මම දිටිමි. ඔව්හු මහ හඬින් මොරගසා, "සිංහාසනයෙහි වැඩ හිඳින අපේ දෙවියන් වහන්සේගෙන් ද බැටළු පෝතකයාණන්ගෙන් ද ගැළවීම පැමිණේ ය"යි කී හ. සියලු දේව දූතයෝ සිංහාසනය ද කුලදෙටුවන් ද ජීවමාන සත්ත්වයන් සතර දෙනා ද සිසාරා, සිංහාසනය ඉදිරියෙහි වැඳ වැටී, දෙවියන් වහන්සේට නමස්කාර කරමින්, "ආමෙන්! ප්‍රශංසාව ද මහිමය ද ප්‍රඥාව ද ස්තුතිය ද ගෞරවය ද බලය ද පරාක්‍රමය ද අපේ දෙවියන් වහන්සේට සදහට ම වේ වා! ආමෙන් ය"යි කී හ.

එවිට කුලදෙටුවන්ගෙන් එක් තැනැත්තෙක් මට කතා කොට, "සුදු සළු පැළඳගත් මොවුහු කවුරු ද? කොතැනින් ආවෝ දැ"යි මාගෙන් ඇසී ය. "මාගේ ස්වාමිනි, ඔබ එය දන්නෙහි ය"යි මම ඔහුට කීමි. එවිට ඔහු මා අමතා, "මොවුහු මහත් පීඩා මැදින් එන්නාහ. ඔව්හු තම සළු බැටළු පෝතකයාණන්ගේ ලෙයින් සෝදා සුදු කර ගත්තෝ ය"යි කී ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 24:1–6

පිළිතුර: දෙවිඳු සරණ සොයන්නෝ මෙවැන්නෝ ය.

ගීය : පොළොව හා එහි ඇති සෑම දෙය ද
සකල ලෝ වාසීහු ද සමිඳුන් සන්තක වෙති.
මුහුදු ජලය පිට පොළොව පිහිටුවා,
සයුරු පත්ලෙහි එය ස්ථාපිත කෙළේ එතුමාණෝ ය.

හිමි තුමන්ගේ කන්දට නගින්නට ශුද්ධ කවුරු ද?
එතුමන්ගේ ශුද්ධ දෙව් මැඳුරෙහි නවතින්නට හැකි කාට ද?
ක්‍රියාවෙන් පිරිසිදු, සිතින් නිර්මල,
නිෂ්ඵල දෙයට වැඳුම්පිදුම් නොකරන,
බොරුවට නොදිවුරන, තැනැත්තාට ය.

එවැනි අයට සමිඳාණෝ ආසිරි දෙති:
මිදුම්කාර දෙවිඳාණෝ මොක් සුව දෙති.
දෙවිඳුන් සොයා යන්නෝ ද
ජාකොබ්ගේ දෙවිඳුන්ගේ සරණ පතා යන්නෝ ද එවැනි අය ය.

## දෙවන දේව ප්‍රකාශනය 1 ජොහන් 3:1–3

*ශුද්ධ වූ ජොහන් තුමන් විසින් ලියන ලද පළමු හසුනෙන් උපුටා ගත් කොටසකි.*

### “උන් වහන්සේගේ ප්‍රකෘති ස්වභාවයෙහිම අපි උන් වහන්සේ දකින්නෙමු.”

බලන්න, පියාණන් වහන්සේ අපට කෙතරම් ප්‍රේම කර ඇද් ද? අපි දෙවියන් වහන්සේගේ දරුවෝ යයි කියන තරමට උන් වහන්සේ අපට ප්‍රේම කළ සේක. ඇත්තෙන් ම අපි උන් වහන්සේගේ දරුවෝ ම ය. ලෝකයා දෙවියන් වහන්සේ නොහඳුනන බැවින්, ඔව්හු අප ද නොහඳුනති. ප්‍රේමවන්තයෙනි, අපි දැනට ම දෙවියන් වහන්සේගේ දරුවෝ ය. එහෙත් අනාගතයේ දී අපි කොයි ආකාර අය වන්නෙමු දැ යි තව ම ප්‍රකාශ වී නැත. කෙසේ වෙතත් උන් වහන්සේ

ප්‍රකාශ වන විට අපි උන් වහන්සේට සමාන වන බව දනිමු. මන්ද, උන් වහන්සේගේ ප්‍රකෘති ස්වභාවයෙහි ම අපි උන් වහන්සේ දකින්නෙමු. උන් වහන්සේ පිළිබඳ මේ බලාපොරොත්තුව ඇති හැම කෙනෙක් ම, උන් වහන්සේ පිරිසිදු ව සිටින්නාක් මෙන්, තමන් ද පිරිසිදු කරගනිති.

දේව වචනය මෙසේ ය.

## සුපුවත් ජය නද — මතෙව් 11:28

ආලේලූයා! ආලේලූයා!
වෙහෙස වන, බර උසුලන වූ ද සියල්ලෙනි,
මා වෙත එන්න: මම ඔබට සහනය දෙමි.
ආලේලූයා!

## සුවිශේෂය — මතෙව් 5:1–12

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ස්වර්ගයෙහි ඔබගේ ඵල විපාක ඉමහත් ය."

ජේසුස් වහන්සේ ජනකාය දැක කන්දකට නැගුණු සේක. උන් වහන්සේ වැඩහුන් කල ශ්‍රාවකයෝ උන් වහන්සේ වෙත ආහ. එවිට උන් වහන්සේ ඔවුන්ට උගන්වමින් මෙසේ වදාළ සේක:

"බැගෑ සිතින් දෙවි සරණ පතන්නෝ භාග්‍යවන්තයෝ ය:
ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය.

ශෝක වන්නෝ භාග්‍යවන්තයෝ ය: ඔව්හු සැනසීම ලබන්නෝ ය.

නිහතමානී ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝ ය: ඔව්හු දේශය උරුම කර ගන්නෝ ය.

යුක්තියට සාපිපාසා ඇත්තෝ භාග්‍යවන්තයෝ ය: ඔව්හු තෘප්තිමත් වන්නෝ ය:

දයාවන්තයෝ භාග්‍යවන්තයෝ ය: ඔව්හු දයාව ලබන්නෝ ය.

නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝ ය: ඔව්හු දෙවියන් වහන්සේ දකින්නෝ ය.

සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය: ඔව්හු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය යි කියනු ලබන්නෝ ය.

යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝ ය: ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය:

මිනිසුන් මා නිසා ඔබට නින්දා පීඩා කොට, නානා විධ අසත්‍ය චෝදනා නගන කල ඔබ භාග්‍යවන්තයෝ ය:

ප්‍රීති ප්‍රමෝද වන්න: මන්ද, ස්වර්ගයෙහි ඔබේ පලවිපාකය ඉමහත් ය. ඔබට පෙර සිටි දිවැසිවරයන්ටත් ඔව්හු එලෙසි ම පීඩා කළහ.”

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*